**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**නීතිවේදී උපාධි පාඨමාලාව - 3 වන මට්ටම**

**1 වන අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය - 2006/2007**

**ශ්‍රී ලංකාවේ නීති පිළිබඳ හැඳින්වීමක් - LWU 1411**

**කාලය - විනාඩි 40 යි**

---

දිනය - 2006.09.05 වේලාව - පෙ.ව.10.00 - පෙ.ව.10.40 දක්වා

---

***එක් ප්‍රශ්නයකට** පමණක් පිළිතුරු සපයන්න.*
*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*

01. "බ්‍රිතාන්‍යයන්ගේ මුල් කාලීන යටත් විජිත ප්‍රතිපත්තිය වූයේ ස්වදේශික පදිංචිකරුවන්ට එකලෙස බලපාන ලෙස ඔවුන්ගේ නීතිය යොදා ගැනීම වූ අතර ඔවුන් ලන්දේසි යුගයේදී පනවන ලද ලන්දේසි ව්‍යවස්ථාවලට ක්‍රියාකාරීත්වය ලබා නොදුන්හ."

    ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

02. ද්‍රවිඩ දෙමාපියන්ට දාව 1976 දී බාලා, ත්‍රිකුණාමලයේ දී උපන්නේ ය. ඔහුගේ වයස අවුරුදු හතේ දී ඔහුගේ දෙමව්පියන් යාපනයට ගිය අතර එහිදී ඔහු පාසල් අධ්‍යාපනය ලැබුවේ ය. වයස අවුරුදු 18 දී පාසැල අතහැරගිය ඔහු, මහනුවර සිටි ඔහුගේ මාමාගේ භෝජනශාලාවේ නැවතී එහිම සේවය කළේය. එම භෝජන ශාලාවේ පිළිගැනීමේ නිලධාරිනියක් වූ ගීතා සමග 1998 දී බාලා විවාහ විය. විවාහයෙන් පසු ඔවුන් වාසය කලේ ගීතාගේ දෙමව්පියන් විසින් ඔවුනට ත්‍යාගකරන ලද මහනුවර පිහිටි නිවසකය. බාලා නිරන්තරයෙන්ම තම දෙමව්පියන්ට මුදල් යැවූ අතර සෑම මාස දෙකකට වරක්ම දෙමව්පියන් බැලීමට යාපනයට ගියේය. ඔහු තම රැකියාවෙන් ලද ආදායමෙන් කොටසක් යාපනයේ පිහිටි මූල්‍ය සමාගමක ආයෝජනය කළේය. වර්ෂ 2000 දී බාලා විසින් යාපනයේ නව නිවසක් මිළදී ගන්නා ලද අතර, තමන් නුදුරු අනාගතයේදී යාපනයේ පදිංචියට එන තෙක් එහි වාසය කරන ලෙස තම දෙමව්පියන්ගෙන් ඉල්ලා සිටියේ ය.

    තමන් අතර නිරන්තරයෙන්ම ඇති වූ අඩ දබර නිසා 2001 දී බාලා තම බිරිඳ අතහැර දමා යාපනයේ තම දෙමව්පියන් සමඟ ජීවත්වීමට පැමිණියේ ය. මහනුවර පිහිටි තම වෛවාහක නිවසේ පදිංචිය ගීතා විසින් තහවුරු කර ගන්නා ලදී. වර්ෂ 2002 දී බාලා ගොඩනැගිල්ලක් අත් කර ගත් අතර යාපනයේ භෝජන ශාලාවක් ද ආරම්භ කළේය. වර්ෂ 2005 දී බාලා හදිසියේ මිය ගියේය.

    බාලාට කුමන නීතියක් අදාළ වන්නේ දැයි දැනගැනීමට බාලාගේ දෙමව්පියන් කැමැත්තෙන් සිටී.

    ඔවුනට උපදෙස් දෙන්න.

- හිමිකම් ඇවිරිණි. -